www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මිලිටරිවාදය හා යුද්ධයට එරෙහි අරගලය සඳහා දේශපාලන පදනම

**The political foundations for the struggle against militarism and war**

**නික් බීම්ස් විසිනි**
**2006 අගෝස්තු 26**

*එක්සත් ජනපදයේ පිටුබලය ලත් ලෙබනනයේ ඊස්රායල යුද්ධයට එරෙහිව, ඕස්ට්‍රේලියාවේ සමාජවාදී සමානතා පක්ෂය විසින් සිඩ්නි හා මෙල්බර්න් නගරවල පිලිවෙලින් අගෝස්තු 22 හා 24 දිනයන්හි පැවැත් වූ ප්‍රසිද්ධ රැස්වීම්වල දී නික් බීම්ස් විසින් ඉදිරිපත් කල වාර්තාව පහත පල වේ. නික් බීම්ස් ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩල සාමාජිකයෙකු ද සමාජවාදී සමානතා පක්ෂයේ ජාතික ලේකම් ද වේ.*

ලෙබනනයේ එක්සත් ජනපද-ඊස්රායල යුද්ධයෙන් පැන නගින දේශපාලන ඉදිරි දර්ශනය පිලිබඳ පලල් ප්‍රශ්න සමහරක් ගැන කතා කිරීම, මෙම රැස්වීම තුල මාගේ කර්තව්‍යයයි. සියල්ලටත් වඩා අධිරාජ්‍යවාදී යුදවාදය ද, ප්‍රචන්ඩත්වය ද පුපුරා හැලීමට එරෙහිව, දූන් වර්ධනය කල යුතු දේශපාලන ක්‍රියා මාර්ගයේ අත්‍යාවශ්‍ය අංගයන් ගෙනහැර දක්වීම ය. වත්මන් යුගයෙහි කැපීපෙනෙන හා අන්තර්සම්බන්ධිත කාරනා දෙකක් දක ගත හැකි ය. පලමු වැන්න, ජාත්‍යන්තර නීතියෙහි සියලු ප්‍රඥප්තීන් මුලුමනින් ම නොතකා හැරීම හා පෙරලා දැමීම ය. දෙවැන්න, සියලු ප්‍රමුඛ ආන්ඩු විසින්, සියලු ජනමාධ්‍යවල එකඟතාවය සහිතව, නිලවසයෙන් ම කරනු ලබන බොරු කීමේ තරමයි. මෙම මාධ්‍ය අද ක්‍රියා කරන්නේ විවිධ ආන්ඩුවල ප්‍රචාරන යාන්ත්‍රනයන්ට නොඅඩු ලෙස ය. 1939 දී අවසාන වසයෙන් දෙවන ලෝක සංග්‍රාමය ඇවිලීයාමට තුඩු දුන්, 1930 දශකය, වත්මන් කාල පරිච්ඡේදය තුල සිහියට නැංවෙන වෙන යමක් නොමැත.

එම කාල පරිච්ඡේදය තුල ගෝලීය අස්ථායිතාවේ ප්‍රධාන මූලය වූයේ ජර්මන් හා ජපන් අධිරාජ්‍යවාදය, එක්සත් ජනපදය හා බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදය යන සිය ප්‍රධාන ප්‍රතිමල්ලවයන් සමග සැසඳීමේ දී තමන් මුහුන පා සිටි අසතුටුදායක තත්වය ලෙස ඔවුන් සැලකූ දෙය වෙනස් කිරීමට දැරූ උත්සාහය යි.

යුරෝපයේ දී මිත්‍රපාක්ෂිකයන් විසින් පලමු වන ලෝක යුද්ධයේ දී පරාජයට පත් කරනු ලැබූ ජර්මන් අධිරාජ්‍යවාදය, තම තත්වය යලි තහවුරු කර ගැනීමට බැලුවේ වර්සේල්ස් ගිවිසුම පෙරලා දැමීම මගින් ය. යුරෝපා මහාද්වීපය තුල අධිපති තත්වයක් ගොඩනගාගැනීම මගින්, එක්සත් ජනපදය හා මහා බ්‍රිතාන්‍යය පසෙකින්, ලෝක බලවතෙකු ලෙස සිය තැන රැක ගැනීම එහි අරමුන විය.

නැගෙනහිර දී, තම රට ම යටත්විජිතයන් බවට පත් වීම වලක්වා ලීමේ අවශ්‍යතාවය වටහා ගත්, යටත් විජිත හා අධිරාජ්‍ය ගොඩනැගීමේ මගට ප්‍රමාද වී ප්‍රවිෂ්ට වූ ජපන් අධිරාජ්‍යවාදය, නැගෙනහිර ආසියාවේ සිය ආධිපත්‍යය පිහිටුවා ලීමට වෑයම් කලේ, චීනය, කොරියාව හා තායිවානය යටත් කර ගැනීමෙනි. මෙය අවසානයේ දී, එක්සත් ජනපද අවශ්‍යතාවන් සමග ගැටුමට තුඩු දුන් අතර, එවකට යුරෝපය තුල පැවති යුද්ධය මහා පරිමානයේ ගෝලීය ගැටුමක් බවට පරිවර්තනය කලේ ය.

අද දින සිය ගෝලීය රාජ්‍යාන්තර නායකත්වය මිලිටරි මාධ්‍යයන් යොදා ගැනීම මගින් අත් කර ගැනීමට බලාපොරොත්තු වන එක්සත් ජනපදය, ප්‍රධාන ආක්‍රමනිකයාගේ ක්‍රියා කලාපය ඉටු කරනු ලබයි. මෙම තත්වය උද්ගත වූයේ කෙසේ දැයි වටහාගැනීම සඳහා කෙටියෙන් හෝ, පසු ගිය දශක හය තුල වර්ධනයේ මූලික ප්‍රවනතාවන් විමසා බැලීම අවශ්‍ය ය.

දෙ වන ලෝක යුද්ධයේ දී ජර්මනිය හා ජපානයේ පරාජය මතින් මිත්‍රපාකෂිකයන් ලැබූ ජයග්‍රහනයෙන් විසි වන සියවසේ මුල් දශක පහ තුල අංග ලක්ෂනය කල අන්තර් අධිරාජ්‍යවාදී ගැටුම්වල අවධිය, අවසානයකට ගෙන ආවේ ය. නව ආර්ථික හා දේශපාලන සමතුලනයක් පිහිටුවාලූයේ, එක් අතකින් එක්සත් ජනපදයේ සුපිරි මිලිටරි හා ආර්ථික ශක්තිය මත ද, අනෙක් අතින් ලෝකය බෙදා ලීමේ සීතල යුද්ධ පිලිවෙත ද, මත පදනම් වෙමිනි.

ප්‍රධාන අධිරාජ්‍යවාදී බලවතුන් අතර එක්සත් ජනපදයට හිමි වූ විශිෂ්ට ස්ථානය රඳා පැවතුනේ, සරලව ම හෝ ප්‍රාථමිකව ම, එය සතු වූ සුපිරි මිලිටරි බලය තුල නොව, එය සතුව තිබූ ආර්ථික බලය ප්‍රයෝජනයට ගැනීමේ හැකියාව මත පදනම් වෙමින්, ධනේශ්වර ආර්ථිකය සමස්තයක් ලෙස ප්‍රසාරනය කිරීම මත ය.

මෙම පොදු ප්‍රසාරනය, විනාශයට පත් යුරෝපයේ පුනර්ජීවනයක් ඇති කලා නොවේ එය එක්සත්

ජනපදයේ ම ආර්ථික, සෞඛ්‍යය හා ශුභසිද්ධිය සඳහා ද නැතුව ම බැරි දෙයක් විය. 1930 ගනන්වල අත් දැකීමෙන් තහවුරු කල කිසියම් දෙයක් වූයේ නම් ඒ, එක්සත් ජනපද ආර්ථිකය තව දුරටත් උතුරු ඇමරිකා මහා ද්වීපයේ වෙලඳ පොල හා සම්පත්වල පදනම මත සංවර්ධනය කල නොහැකි බවත්, එයට සමස්ත ලෝකය ම අවශ්‍ය වන බවත් ය.

වෙනත් වචනවලින් කිව හොත්, පශ්චාත් යුද්ධ කාල වකවානුව තුල, එක්සත් ජනපදයට එහි ආධිපත්‍යය සහතික කල හැකි වූයේ, අනෙකුත් ප්‍රධාන ධනපති බලවතුන් ආර්ථික වසයෙන් යලි ගොඩනගනතාක් දුරට පමනකි. කෙසේ වුවද එම කර්තව්‍යයේ දී එක්සත් ජනපදය තමන් සතු සාපේක්ෂ ආර්ථික ආධිපත්‍යයට ද වල කපා ගත්තේ ය. පශ්චාත් යුද්ධ සමතුලිතයේ හදවතෙහි ම පැවති මෙම ප්‍රතිවිරෝධය ම එහි කඩා වැටීමට ද තුඩු දුන්නේ ය.

එක්සත් ජනපදයේ සාපේක්ෂ පරිහානිය සලකුනු කිරීමේ දී 1971 හා 1989 යන වසර දෙක කැපී පෙනේ. පශ්චාත් යුද්ධ ආර්ථික ප්‍රසාරනය පදනම සැකසූ ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමය, 1971 අගෝස්තුවේ දී එක්සත් ජනපද ජනාධිපති නික්සන් විසින් ඇමරිකානු ඩොලරයේ රන් පිටු බලය ඉවත් කිරීමෙන් පසුව බිඳ වැටුනි. ඊනියා බ්‍රෙට්න් වුඩ්ස් මූල්‍ය පද්ධතියේ මලගම සලකුනු කලේ, එක්සත් ජනපදයේ සාපේක්ෂ පරිහානියෙහි නාටකාකාර ප්‍රකාශනයකි. යුද්ධාවසානයේ අවුන්සයකට ඩොලර් 35 ක අනුපාතයකින් රන් සඳහා ඩොලර් හුවමාරු කිරීමේ හැකියාව මත පදනම් වෙමින්, එම පද්ධතිය පිහිටුවාලීමේ දී වූයේ එක්සත් ජනපදයේ ඉමහත් සුපිරි බලයෙහි අර්ථය වූයේ, ලෝක ආර්ථිකයෙහි ප්‍රධාන ගැටලුව ඩොලර් වෙත පවරා ගෙන තිබෙන බවයි. සියවස් කාලකට පසුව, නික්සන් රත්තරන් ජනේලය වසාදමනු ලැබුවේ, අවශේෂ ලෝකයෙහි සැරිසරන ඩොලර්වලට ඇප වීමට තව දුරටත් එක්සත් ජනපදයට නොහැකි වීම නිසා ය. එය බැරෑරුම් තීරනයක් වූයේ එක්සත් ජනපදය තව මත් අධිකාරවත් ආර්ථික බලවතා වන අතර ම සාපේක්ෂ වූ සුපිරි බලයට යටින් වල කැපෙන ක්‍රියාවලියක නිමග්න වීම නිසා ය.

වර්ෂ 1989 බර්ලීන් තාප්පය කඩා වැටෙන තතු තුල එක්සත් ජනපදය ලෝකයේ විශාලතම නය හිමි ජාතියෙහි සිට ලොකු ම නය කාර ජාතිය බවට පරිවර්තනය වෙමින් පැවතුනි. කෙසේ වුව ද පතුලෙහි වූ මෙම දුබලතාවය නැගෙනහිර යුරෝපයේ ස්ටැලින්වාදී තන්ත්‍රයන්ගේ බිඳ වැටීම හා අවසාන වසයෙන් 1991 දී සෝවියට් සංගමය ඈවර කිරීමත් සමග අත්වැල් බැඳගත් විජයග්‍රහනය මගින් යම් කාලයකට වසංකර තිබුනි. සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමය අභාවයට පත්වීම බැලූබැල්මට පෙනීගියේ එක්සත් ජනපදයේත් වඩාත් පොදුවේ ධනේශ්වර පද්ධතියේමත් ඓතිහාසික ජයග්‍රහනය සලකුනු කල බවකි. සිදු වී ඇත්තේ මෙය බව මහ හඬින් කියාපාන අයගේ සහායක් ද නොමැත.

පශ්චාත් යුද්ධ කාල පරිච්ඡේදය තුල ලෝක දේශපාලනය හැසිරවීමෙහි ලා ඒ සා තීරනාත්මක ක්‍රියා කලාපයක් ඉටු කල සීතල යුද්ධය මත පදනම් වූ දේශපාලන ව්‍යුහයන්ගේ අවසානය සැබැවින්ම මෙ මගින් සලකුනු කෙරෙයි. සීතල යුද්ධයේ අවසානය, සාමයේ නව අවධියකට දොර විවරකරනවා වෙනුවට එන්ට එන්ටම පලල් පරිමානයකින් මිලිටරිවාදයේ පුපුරා යාමකින් සලකුනු කරයි. මැද පෙරදිග තරම් මේ ක්‍රියා කලාපය හොඳින් දැක ගත හැකි වෙනත් තැනක් ඇත්තේ නැත.

## එක්සත් ජනපදය හා මැද පෙරදිග

මැද පෙරදිග හා එහි ඇති සුවිශාල තෙල් සම්පත් පාලනය, එක්සත් ජනපදයට හැමවිටම තීරනාත්මක වැදගත්කමකින් යුත් කාරනයක් වූයේ ය. 1943 දී රූස්වෙල්ට් පාලනාධිකාරය සෞදි අරාබියේ ආරක්ෂාව එක්සත් ජනපදයේ මූලෝපායික අවශ්‍යතාවන් පිලිබඳ කාරනයක් වන බව ප්‍රකාශ කලේ එහි පෘථුල ලෙස පැතිර ඇති තෙල් සංචිත සොයා ගැනීමත් සමග ය. 1945 පෙබරවාරියේ දෙවැනි ලෝක සංග්‍රාමයේ තීරනාත්මක දවස්වල දී හා සෞදි රජුගේ මරනයට පෙර සති කිහිපයේ දී රූස්වෙල්ට්, පශ්චාත් යුද සබඳතාවයන්හි පදනම පිහිටුවා ගැනීම පිලිබඳව - සෞදි පාලනය පවත්වාගැනීමේ දී එයට ආරක්ෂාව සැලසීම සඳහා එක්සත් ජනපදය කටයුතු කරන අතර හිලව්වට අඛන්ඩව තෙල් සැපයීම සිදු විය යුතු - රජු සමග සාකච්ඡා කලේ ය.

1953 දී සීඅයිඒ සංවිධානය කුමන්ත්‍රනයක් සංවිධානය කල අවස්ථාවේ දී ඉරානයේ සිදුවීම් මගින් සනිටුහන් කලේ තෙල්වල වැදගත්කමයි. බ්‍රිතාන්‍ය තෙල් ව්‍යාපාර ජනසතු කිරීමට සූදානම් වූ අගමැති මොසැඩෙක් ගේ ජාතිකවාදී ආන්ඩුව පෙරලා දමුනු අතර මොහොමඩ් රේසා පාලවි ෂා ලෙස යලි බලයට පත් කෙරුනි. එක්සත් ජනපදයෙන් ලැබුනු දැවැන්ත අවි තොග සමගින් ෂා පාලන තන්ත්‍රය පර්සියන් ගල්ෆ්හි බාරකරුවා බවට පත්විය.

1970 ගනන් මුලහරියේ දී සිද්ධීන් නව හැරීමක් ගැනීමට පටන් ගත්තේ ය. මාස ගනනක් තුල තෙල් මිල ගනන් සිව් ගුනයකින් ඉහල නැගුනු අතර 1973-74 තෙල් අර්බුදය මධ්‍යයේ මැද පෙරදිග ජාතිකවාදී නැගී ඒමත්, පැරනි ආර්ථික පර්යායේ බිඳ වැටීමත් දැකිය හැකි විය.

1975 දී "අරාබි තෙල් අල්ලා ගැනීම" යන මැයෙන් ලිපියක් හාපර් සඟරාවේ පලවිය. අරාබි තෙල් බිම් අල්ලා ගැනීමත් හැසිරවීමත් මගින් ඇමරිකාවට සිය ගැටලු නිරාකරනය කර ගත හැක්කේ කෙසේ දැයි එය පෙන්වා දුන්නේ ය. ඒ සමාන ලිපි වෙනත් ප්‍රකාශනවල ද පල විය. ඒ සියල්ල පදනම් වූයේ රාජ්‍ය ලේකම්

හෙන්රි කිසිංජර් විසින් සපයන ලද මග පෙන්වීම මත ය.

ඇමරිකානු පාලනාධිකාරය මුහුන පෑ ගැටලුව වූයේ පර්සියානු ගල්ෆ් ප්‍රදේශය තුල එක්සත් ජනපදයට මිලිටරි බලයක් නොමැති වීමයි. 1979 දී ෂා පෙරලා දැමීමත් නව වටයකින් තෙල් මිල නැගීමත් සමග එක්සත් ජනපදයට දැඩි පහරක් එල්ල විය. ගල්ෆ් ප්‍රදේශය එක්සත් ජනපදයේ බලපෑමට නතු කලාපයක් ලෙස නම් කල, කාටර් ප්‍රකාශ කලේ "පර්සියන් ගල්ෆ් ප්‍රදේශයේ පාලනය ආරක්ෂා කර ගැනීමට ඕනෑ ම පිටස්තර බලවේගයක් විසින් දරන උත්සාහයක් ඇමරිකා එක්සත් ජනපදයේ වැදගත් අවශ්‍යතාවන්ට පහරක් ලෙස සලකනු ලබන අතර එවන් ඕනෑ ම ප්‍රහාරයක් මිලිටරි බලය ද ඇතුලත් ඕනෑ ම මාධ්‍යයක් යොදාගැනීම මගින් නතර කර දමනු ඇත." (මෙම තර්ජනයට ඔබින පරිදි ඔහු ක්ෂනික ගොඩබැස්සීමේ බලකායක් ගොඩනැගී ය.

1980 ගනන්වල ඉරාන ඉරාක යුද්ධය අවධියේ දී සදාම් හුසේන් තන්ත්‍රයට පිටුබලය සපයමින් ඉරානය අස්ථාවර කිරීමට එක්සත් ජනපදය වෑයම් කලේ ය. රසායනික අවි නිෂ්පාදනය සඳහා ඇන්ත්‍රැක්ස් ඇතුලු ජීව විද්‍යාත්මක මූලද්‍රව්‍ය ද සමග යුද බිමේ වාර්තා ද එක්සත් ජනපදය විසින් ඉරාකයට සපයන ලදි. යුද්ධය ගෙන යාමට පහසුකම් සලසනු වස් 1983 හා 1990 අතර කාලය තුල භාන්ඩ නය සංස්ථා වැඩ පිලිවෙල හරහා අවම වසයෙන් ඩොලර් බිලියන 5ක් ඉරාකයට ලබා දුන් අතර සැලකියයුතු ආර්ථික ආධාර ද සපයන ලදි.

ගැටුමේ අට අවුරුදු කාල සීමාව අවසන් වන විට බිලියන 40 කට වැඩි නයකට මුහුන දී සිටි ඉරාක පාලන තන්ත්‍රය මංමුලා සහගත ලෙස මූල්‍ය සම්පත් සොයමින් සිටියේ ය. එහෙත් ඉරාක භූමියෙන් තෙල් තමන් වෙත ඇදගනිමින් ද ඔපෙක් සලාකයට පිටින් තෙල් අලෙවි කරමින් ද, කුවේට් පාලන තන්ත්‍රය, මෙයට යටින් වල කැපී ය. 1990 ජූලි මස සදාම් හුසේන් ඇමරිකානු තානාපති ඒප්‍රිල් ගලාස්පිගෙන් ඉරාක කුවේට් මතභේදය පිලිබඳව එක්සත් ජනපදයේ ආකල්පය කුමක් දැයි විමසූ කල් හි කුවේටය සමග ඇති ඉරාකයේ දේශ සීමා මතභේදය වැනි අන්තර් අරාබි ගැටුම් පිලිබඳව ඇමරිකාව උනන්දුවක් නොදක්වන බව ඔහුට පවසන ලදි. මෙය ඉදිරියට යාමට සංඥාවක් ලෙස සලකනු ලැබිනි.

කෙසේ වුව ද, ඉරාකය කුවේටය ආක්‍රමනය කලවිට එක්සත් ජනපදය තම ගල්ෆ් යුද හවුල සංවිධානය කලේ ය. එක්සත් ජනපදය සඳහා වැදගත් මූලෝපායික පිවිසුමක් යුද්ධයෙන් සම්පාදනය විය. 1991 වන තෙක්, තම භූමියෙහි ඇමරිකානු කඳවුරු සඳහා ඉඩ ලබා දීමට කිසිදු ගල්ෆ් රාජ්‍යයක් ඒත්තු ගන්වා ගැනීමට නොහැකිව තිබුනි. ගල්ෆ් යුද්ධය ඇරඹීමත් සමග සෞදි අරාබිය හා අනෙකුත් රාජ්‍යයන් තව දුරටත් ඇමරිකානු මිලිටරියේ ඍජු මැදිහත් වීමකට විරුද්ධ නොවී ය.

කුවේටයට පමනක් නොව සවුදි අරාබියට ද අනිකුත් රාජ්‍යවලට ද තර්ජනය කරමින් 1990-91 ගල්ෆ් යුද්ධය, මැදපෙරදිග බලවතා බවට පත් වීමේ ඉරාක තන්ත්‍රයෙහි උත්සාහයන්ට එරෙහිව කුඩා කුවේට් ජාතියේ නිදහස සඳහා වූ යුද්ධයක් ලෙස 1990-91 ගල්ෆ් යුද්ධය හඳුන්වා දෙනු ලැබිනි. සදාම් හුසේන් නව හිට්ලර් කෙනෙක් ලෙස යක්ෂාරූඪ නොකෙරෙන කිසිවක් නොඉවසනු ලැබිනි.

සැබැවින් ම යුද්ධයෙන් සලකුනු කෙරුනේ විජිතකරනයේ නව අවධියක ආරම්භය යි. එය සිදු වූයේ එක්සත් ජාතීන්ට පටහැනිව යමින් නොව එහි අනුග්‍රහය යටතේ ය යන්න අර්ථභාරී ය. එවක, අපගේ ව්‍යාපාරය වන හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව (හජාජාක) මෙසේ සඳහන් කලේ ය.

"ඉරාකය විනාශ කිරීමේ හා කොල්ලකෑමේ සිය අධිෂ්ඨානය තුල අධිරාජ්‍යවාදීන් ප්‍රදර්ශනය කලේ මවිත කරවන සුලු එකමුතු කමකි. අධිරාජ්‍යවාදී අනාචාරයේ තරමක් කිලිටි මධ්‍යස්ථානය වන එක්සත් ජාතීන්ගේ කටයුතු තුල දක්නට ලැබුනේ මිලිටරි වෛශ්‍ය නිවාසයක දී ගෞරවයට පාත්‍රවීමේ අරමුන පෙරදැරිකරගන්නාක් වැනි 'වැඩේට සහභාගිවීම සඳහා' ආරක්ෂක මන්ඩලයේ එලිපත්තෙහි පෙල ගැසී සිටින ධනේශ්වර රාජ්‍ය තාන්ත්‍රිකයන් රොත්තකි. ඉරාකයට එරෙහි ප්‍රහාරය සඳහා එක්සත් ජනපදයේ කැඳවුමට බ්‍රිතාන්‍ය, ප්‍රන්සය, ජර්මනිය හා ජපානය පමනක් නොව අඩු වැදගත් කමකින් යුතු අධිරාජ්‍යවාදීන් රංචුවක් ද ප්‍රතිචාර දැක්වූහ. - ඕස්ට්‍රේලියාව, කැනඩාව, ඉතාලිය, ස්පාඤ්ඤය, නෙදර්ලන්තය, බෙල්ජියම, ඩෙන්මාර්කය, හා ස්විට්සර්ලන්තය ඉන් සමහරෙකි. - ඩයිනමයිට් සොයා ගත් පුද්ගලයාට ගෞරව පිනිස වාර්ෂිකව කීර්තිමත් "සාම ත්‍යාගය" පිරිනමනු ලබන්නා වූ නෝර්වේ රාජ්‍ය පවා ඉරාක විරෝධී කුරුස යුද්ධයට දායකත්වය සැපයී ය. හවුල වෙනුවෙන් වූ පුලුල් සහභාගිත්වයෙන් සලකුනු කරන්නේ, ඉරාකයට එරෙහි යුද්ධය, යටත්විජිතවාදයේ ප්‍රතිපත්තිය පන ගැන්වීම නීති යුක්ත කරන්නේ ය යන, සියලු අධිරාජ්‍යවාදී බලවතුන් තුල ඇති, අප්‍රකාශිත වැටහීම ය. ඇමරිකාව මෙහෙයවන යුද්ධයට සහාය දැක්වීම, අනෙකුත් අධිරාජ්‍යවාදී බලවතුන් දුටුවේ එක්සත් ජනපදයේ අනාගත එකඟතාව වෙනුවෙන් නැත හොත්, ආසියාවේ අප්‍රිකාවේ, මැද පෙරදිග හා ලතින් ඇමරිකාවේ ඔවුන්ගේ ම ව්‍යවසායන් සඳහා පූර්න සහයෝගය ලබා ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු අත්තිකාරම ලෙස ය."

එහෙත් හජාජාක තව දුරටත් පෙන්වා දුන්නේ හොරුන් අතර මිත්‍රත්වයක් නැති බවයි. 20 වන සියවසේ මුල් දශකයන්හි දී මෙන් කුඩා රටවල් කොල්ලකෑම අවසානයේ දී, අධිරාජ්‍යවාදී බලවතුන් අතර ම ගැටුම් ඇතිවීමට තුඩු දුන්නා සේ ම, විජිතකරනය යලි ඉස්මතුවීමේ දුරදිග යන ඇඟවුම් පවතින බවට එය අනතුරු ඇඟවූවා ය.

ඉරාකය පිලිබඳ කාරනයේ දී, ගැටුම් මතුපිටට පැමිනීමට වැඩි කල් ගතවූයේ නැත. ඉරාකය යටත් කිරීමේ කොන්දේසි යටතේ පවත්වා ගෙන ගිය ආර්ථික සම්බාධක එහි අවි විනාශ කරන තෙක් ඉවත් නොකරන බව ප්‍රකාශ වීම, සම්බාධකවලින් පසුව ඉරාකය තුලින් අත් කර ගත හැකි දැවැන්ත මූල්‍ය ප්‍රතිලාභ පිලිබඳ ප්‍රධාන බලවතුන් අතර මතභේද ඉස් මතු වීම, සම්බාධක ඉවත් කොට සම්බන්ධතා සාමාන්‍ය තත්වයට පත් කල හොත් ලෝකයේ දෙවන විශාලතම හා ලාභදායී මෙන් ම ප්‍රමිතියෙන් ඉහල තෙල් සංචිත ප්‍රයෝජනයට ගනිමින් අනෙකුත් බලවතුන් ලාභ ලබනු ඇතැයි එක්සත් ජනපදය බිය විය.

## ඉරාකයේ පාලන තන්ත්‍ර වෙනස

එක්සත් ජනපදය සිටියේ ගැඹුරුවන උභතෝකෝටිකයකට මුහුන දෙමිනි. එක් අතකින් එයට ඉරාකය සමග සබඳතා සාමාන්‍ය තත්වයකට ගෙන ආ නොහැකි ය. ඒ දැනට මත් ආන්ඩුව සමග තෙල් කොන්ත්‍රාත්තු ඇති කර ගෙන තිබෙන ප්‍රන්සය හා රුසියාව ඇතුලු එහි ආර්ථික ප්‍රතිවාදීන් ඉන් වාසි සලසා ගැනීම නිසා ය. අනෙක් අතට සම්බාධක ක්‍රියාවලියක් තව දුරටත් පවත්වා ගෙන යාම එන්ට එන්ටම දුෂ්කර වී තිබේ. මෙයින් ගොඩ යාමේ මාධ්‍ය වූයේ "පාලන තන්ත්‍ර" වෙනසයි. 1988 ඔක්තෝබරයේ දී එක්සත් ජනපද කොන්ග්‍රසය ඉරාක විමුක්තියේ පනත සම්මත කලේ ය. එමගින් "ප්‍රජාතන්ත්‍රවාදය කරා ඉරාකයේ පරිවර්තනයට සහය දක්වන ක්‍රියා මාර්ගයක් සකස්කිරීම" සඳහා ක්‍රියාත්මක "ප්‍රජාතාන්ත්‍රික විපාක්ෂික සංවිධාන" වලට ඩොලර් මිලියන 100ක පමන මුදලක් සැපයීමට නියමිත විය. වෙනත් වචනවලින් කිවහොත් "පාලන තන්ත්‍ර වෙනස" ක ප්‍රතිපත්තිය ක්ලින්ටන් පරිපාලනයේ මූලිකත්වයෙන් ආරම්භ විය.

2000 පැවති රිපබ්ලිකන් මැතිවරන වේදිකා තුලට ද, ඉරාක විමුක්තියේ පනත ඇතුලත් කර ගැනුනි. බුෂ් පරිපාලනයේ මුල් ම දවස්වල ඉරාකය ආක්‍රමනය කිරීමේ ප්‍රශ්නය සාකච්ඡාවට බඳුන් විය. ආක්‍රමනයක් ඔහේ දියත් කල නොහැකි ය. ඒ සඳහා නිමිත්තක් තිබිය යුතු ය.

ඇමරිකානු අධිරාජ්‍යවාදය පොරබදමින් සිටි ගැටලු, 1997 දී පල වූ ස්බිග්නිව් බ්‍රෙසින්ස්කි ගේ *ද ග්‍රෑන්ඩ් චෙස් බෝර්ඩ්* නමැති කෘතිය තුල ගෙනහැර දැක්වේ. ඔහු විස්තර කල පරිදි එක්සත් ජනපදයට එහි ගෝලීය අධිකාරය ක්‍රියාවට නැංවීම දුෂ්කර වූයේ "ඇමරිකාව දේශීයව ප්‍රජාතන්ත්‍රවාදී ද විදේශීයව ඒකාධිකාරී ද" වූ බැවින් ය. විදේශීය බලය පවත්වා ගැනීම ජනතා ප්‍රසාදය දිනාගත්තා වූ අරමුනක් වූයේ නැත. "ජන ජීවිතයේ පොදු විශ්ශ්ඃඛානය ට එල්ල කෙරෙන හදිසි තර්ජනයක හෝ අභියෝගයක කොන්දේසි යටතේ හැර" බ්‍රෙසින්ස්කි සඳහන් කරයි.

2001 සැප්තැම්බර් 11 සිදු වීම්, එම තර්ජනය සපයා දුන්නේ ය. 9/11 පිලිබඳව පිලිතුරු නොසැපයූ බොහෝ ප්‍රශ්න ඉතිරිව තිබේ. එහෙත් එක දෙයක් නිසැක ය. එක්සත් ජනපදය විසින් ගෝලීය ආධිපත්‍යයේ යුද්ධයක් සඳහා දියත් කල නිමිත්තයි. "ත්‍රස්තයට එරෙහි යුද්ධය" හෝ දැන් පෙන්ටගනයේ නිල කවයන් අතර කථාබහට ලක් වන "දිග් ගැස්සුනු යුද්ධය" වැනි කුමක් වුවත්, මැදපෙරදිගත් ජාත්‍යන්තරවත් සිය රාජ්‍යාන්තර නායකත්වය පිහිටුවා ගැනීමේ එක්සත් ජනපද ව්‍යායාමය ක්‍රියාවට නැඟෙනු ඇත්තේ මෙම රාමුව තුලයි.

වත්මන් යුගයේ පුපුරන සුලු ස්වභාවය අවශ්‍යයෙන් ම පැන නගින්නේ, එක්සත් ජනපදය සිය ගෝලීය ආර්ථික තත්වයේ පිරිහීම මිලිටරි මාධ්‍යන්ගෙන් හානිපූරනය කිරීමට උත්සාහ කිරීමේ කාරනයෙනි. මෙම ක්‍රියා මාර්ගයට එහි ම නිර්දය තර්කනය ක් තිබේ. එක්සත් ජනපදය මිලිටරි ගැටුම තුල වඩාත් ගැඹුරට පැටලී යත්ම එය, බලය යෙදීම වෙත වඩාත් නැඹුරු වන්නේ මිලිටරි පරාජයන් නිසා ම නොව ජයග්‍රහනයන් මගින් නිර්මානය කල ගැටලු ජය ගැනීම සඳහා ය.

ගල්ෆ් යුද්ධය අවධියේ දී, *වෝල්ස්ට්‍රීට් ජර්නලය*, දැන් අපකීර්තියට පත්ව ඇති, "බලය වැඩ කරයි" යන සටන් පාඨය වාත්තු කලේ ය. එය බුෂ් පරිපාලනයේ ක්‍රමවේදය බවට පත්ව තිබේ. කෙසේ වුව ද, ඉතිහාසයේ "බලයේ න්‍යාය" ට දායක වන්නෝ, ආර්ථික තත්වය දේශපාලන මාධ්‍යයන්ගෙන් නිර්නය වේ යයි ද, දේශපාලන මාධ්‍යයන්, අවසානයේ දී බලය, මූලික ආර්ථික කොන්දේසි යලි හැඩ ගැස්වීම සඳහා යොදා ගත හැකි ය යන මිත්‍යාවට හසුව සිටිතියි ද, ෆෙඩ්රික් එංගල්ස් මනාව පැහැදිලි කර ඇත.

මෙම දුෂ්ට ආස්ථානයෙන් ඉරාකයේ සිදුවීම්වලට අවධානය යොමු කරන්න. එක්සත් ජනපද මිලිටරියට ඉරාකය දින කිහිපයක් තුල ජය ගැනීමට හැකි වූ බව "මෙහෙවර ඉටු කලේ ය"යි 2003 මැයිවල බුෂ් ප්‍රකාශ කිරීමත් සමග පැහැදිලි විය. එම දිනවල බුෂ් ධර්මතාවේ ආධාරකරුවන් කියා සිටියේ, දෙ වන ලෝක සංග්‍රාමයෙන් පසු කාලයේ එක්සත් ජනපදය, ජර්මනියට හා ජපානය යටත් කර ගෙන සිටීමේ අත් දැකීම පෙන්වා දෙන්නේ, ඉරාකය තුල ද ශක්‍ය ප්‍රජාතන්ත්‍රවාදයක් හා සමෘද්ධිමත් ආර්ථිකයක් ගොඩ නැගීමේ හැකියාව පවතින බව ය.

ඔවුන් එක කාරනයක් අතහැර දැමූහ. එනම්, අතර මැදි කාල පරිච්ඡේදය තුල එක්සත් ජනපද ආර්ථික තත්වයේ පිරිහීම යි. මෙහි අර්ථය, ඉරාකය තුල වොෂින්ටනයේ ආර්ථික වැඩ පිලිවෙල, ජපානයේ හෝ යුරෝපයේ තුල ගෙන ගිය ආර්ථික ප්‍රතිනිර්මානය වැන්නක් මත පදනම් නොවන බවත්, ඊට පටහැනි ලෙස එය, කොල්ලකෑම, පුද්ගලීකරනය හා හැලිබර්ටන් වැනි අනුග්‍රාහක ඇමරිකානු සමාගම්වලට දැවැන්ත වාසි සැලසීමක් විය.

එක්සත් ජනපද ආර්ථික ක්‍රියා මාර්ගයෙහි අරමුන, රට කොල්ලකන අතර තුර ඉරාක මහජනතාවගේ

තත්වය වැඩි දියුණු කිරීම නොව අන්තයට ම පිරිහෙළීම යි. ඒ අයුරින් රූකඩ පාලන තන්ත්‍රයක් ඇටවීම සඳහා වූ එහි ඉදිරි දර්ශනය, අවශ්‍යයෙන් ම පදනම් වූයේ ජාතික කන්ඩායමික බෙදීම් නිර්මානය කිරීමේ, බෙදා පාලනය කිරීමෙහි, පැරනි අධිකාරවාදී උපාය මතය.

මෙහි ප්‍රතිඵලය වූයේ, කන්ඩායමික සිවිල් යුද්ධයක් පැන නැගීමත්, එක් අතකින් ෂියා දේශපාලන හා ආගමික සංවිධාන හා අනෙක් අතින් එක්සත් ජනපද මිලිටරිය අතර අඩමාන හා අවදානම් ලෙස තුලනය වන ආන්ඩුවක් ඇති කිරීම ය. ලෙබනන් යුද්ධය පැවති අවධියේ දී, හෙස්බුල්ලාවරුන් හෙලා දැකීම ඉරාක අගමැති විසින් ප්‍රතික්ෂේප කිරීමත් සමග බලය බාර ගැනීමට අලුත් ප්‍රබලයෙකු අවශ්‍ය වී තිබෙන බව එක්සත් ජනපද පරිපාලනය තුල කෙරෙන කතාබහෙන් පැහැදිලි වේ.

ඒ සමග ම මිලිටරිවාදයේ තර්කනය ද දිගහැරෙන්ට පටන් ගෙන තිබේ. ශක්‍ය රූකඩ පාලන තනත්‍රයක් ඉරාකය තුල ඇටවීමට අසමත් වීමේ අර්ථය මිලිටරි මැදිහත් වීම පුලුල් කල යුතු බවයි. ඉරාකය සිරියාව මතට ද, දැන් අපකීර්තියට පත්ව ඇති කොන්ඩලීසා රයිස් ගේ "නව මැදපෙරදිගක්" පිලිබඳ වැකිය ක්‍රියාවට නැගීම දක්වා ද එය ගෙන යායුතු ය.

## 'දිග් ගැස්සුන යුද්ධය'

කෙසේ වුව ද, එක්සත් ජනපද මිලිටරි කටයුතුවල බලක්ෂේත්‍රය එම කලාපයට පමනක් සීමා නොවනු ඇත. පෙබරවාරියේ දී නිකුත් කල පෙන්ටගනයේ සිව් වසරක ආරක්ෂන විමර්ෂනයේ වචනවලට අනුව " එක්සත් ජනපදය වනාහි දිග් ගැස්සියහැකි යුද්ධයක පැටලී සිටින ජාතියකි." මෙම යුද්ධයේ විෂය පථය සමස්ත ලෝක ගෝලයයි. මූලෝපායිකව මංමුලාවන රටවල තේරීම හැඩ ගැස්වීම" යන හිසින් යුත් විමසුම සඳහන් කලේ "එක්සත් ජනපදයේ ද එහි සගයන්ගේ හා කොටස්කරුවන්ගේ අනාගත මූලෝපායික ආස්ථානය හා ක්‍රියාත්මක වීමේ නිදහස කෙරෙහි, ප්‍රධාන හා නැගීඑන බලවතුන්ගේ කැමැත්ත බලපානු ඇත. සහයෝගිතාවය සහ අන්‍යෝන්‍ය ආරක්ෂක අවශ්‍යතාවන් අභිවර්ධනය කෙරෙන ආකාරයට මෙම තේරීම් හැඩ ගැස්වීමට එක්සත් ජනපදය උත්සාහ කරනු ඇත. ඒ සමග ම එක්සත් ජනපදයත් එහි සගයන් හා හවුල්කරුවන් විසින් ප්‍රධාන හා නැගී එන බලවතුන් අනාගතයේ දී සතුරු මාවතක් තෝරා ගැනීමේ හැකියාව ද වැලැක්විය යුතු ය."

එවන් සමහර ශක්‍ය අපේක්ෂකයන් දැනට මත් නිශ්චය කර තිබේ. "වෙනිසියුලාව වැනි සමහර රටවල, ජනතාවාදී දේශපාලන ව්‍යාපාර මතු වෙමින් තිබේ." යයි එහි සඳහන් වේ. ඒවා ආර්ථික හා දේශපාලන අස්ථායිතාවයේ මූලයන් ය. රුසියාව විස්තර කර ඇත්තේ "සංක්‍රමනීය" රටක් ලෙස ය. මොස්කෝව "ප්‍රයෝජනවත් හවුල්කරුවෙකු" ලෙස එක්සත් ජනපදය විසින් පිලිගන්නා අතර ම අනෙකුත් රාජ්‍යයන්ගේ භෞමික අඛන්ඩතාවය හා ආර්ථික දේශපාලන නිදහසට බලපෑම් කිරීම එහි "කනස්සල්ලට" හේතු වේ. යම් විශේෂ කලාපයක් නම් කර නැති වුවත් ලියවිල්ල කලාපයේ බලශක්ති සම්පත් මත "බලපෑමක් ඇති කිරීමට උත්සාහ කරන පිටස්තර බලවේගයන්" - මධ්‍යම ආසියාවේ රාජ්‍යය කෙරෙහි - ගැන සඳහන් කරයි.

එක්සත් ජනපදය සමග මිලිටරිමය වසයෙන් තරග කිරීමේ දී ඉමහත් විභවයකින්" යුත් රටක් ලෙස චීනය නම් කර තිබේ. එක්ව ගත් විට ලිපිය "සියලු ම ප්‍රධාන හා නැගී එන බලවතුන්ගෙන්" ඉල්ලා ඇත්තේ නිර්මානාත්මක නලුවන් හා උනන්දුවන්නන් ලෙස ජාත්‍යන්තර පද්ධතියට ඒකාබද්ධවන ලෙස යි. එහි පැහැදිලි කර නොමැති මෙම ජාත්‍යන්තර පද්ධතියේ රාමුව අර්ථකථනය කෙරෙන්නේ එක්සත් ජනපදයේ අවශ්‍යතාවන් මගිනි. එය බුෂ් කල පරිදි වඩා ගොරහැඩි ලෙස දැක්වුව හොත් "එක්කෝ ඔබ අප සමග ය, නැත්නම් අපට එරෙහිව ය".

එක්සත් ජනපදයේ "දිග් ගැසුන යුද්ධය" මෙහෙයවෙන්නේ කොතැනට ද? එක් නිශ්චිත ලක්ෂයක දී, 20 වැනි සියවසේ ලේවැකි ඉතිහාසය පෙන්වා දී ඇති පරිදි එය ව්‍යසනයක් රැගෙන එනු ඇත. මෙම ඉතිහාසය තව දුරටත් පෙන්වා දී ඇත්තේ ව්‍යසනය, සාමය සහතික කර දෙන ලෙසට එක්සත් ජාතීන් වැනි සංවිධානවලින් ද, එක් හෝ තවත් අධිරාජ්‍යවාදී බලවතෙකුගෙන් ද ඉල්ලා සිටීම මගින් වලක්වා ගත නොහැකි බවය. 2003 ඉරාක යුද්ධය පැමිනිය දී, එක්සත් ජනපදයේ ආක්‍රමනයට එරෙහිව පියවරක් ගැනීම එක්සත් ජාතීන් විසින් ප්‍රතික්ෂේප කල අතර ආක්‍රමනයෙන් පසුව එය යුක්තිසහගත කලේ ය. ලෙබනනයට එරෙහි ප්‍රහාරය හමුවේ, 1930 ගනන්වල එහි කාලකන්නි පූර්වගාමියා වූ ජාතීන්ගේ සංගමය මෙන් ම, එක්සත් ජනපදය හා ඊස්රායලය සිය විනාශකාරී යුද්ධය දියත්කරද්දී එක්සත් ජාතීන් සරලව ම පසෙකට වීසි වී සිටියේ ය.

මිලිටරිවාදය හා යුද්ධය අවසන් කර අව්‍යාජ සාමයක් සහතික කර දිය හැක්කේ ලෝකයේ එක ම එක සමාජ බලවේගයකට පමනි. එම බලවේගය ජාත්‍යන්තර කම්කරු පන්තිය යි. කෙසේ වුවත් මෙම කර්තව්‍යය සඳහා එය ස්වාධීන ක්‍රියා මාර්ගයක් මත සටන්වැදිය යුතු ය. මෙම ඉදිරි දර්ශනයේ පදනම වන්නේ, යුද්ධයේ මූලාශ්‍රය වන ජාතික රාජ්‍ය පද්ධතිය හා පුද්ගලික ලාභය මත පදනම් වූ ධනේශ්වර පද්ධතිය ම අවසන් කිරීම මිස, ඒ හෝ මේ අධිරාජ්‍යවාදී බලයකට බලපෑම් කිරීමට උත්සාහ දැරීම නොවන බව වටහා ගැනීම ය. සමාජවාදී සමානතා පක්ෂයේ හා අපගේ ලෝක පක්ෂය වන හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවෙහි ක්‍රියා මාර්ගය වන්නේ මෙයයි.

අවසාන වසයෙන් මෙම ක්‍රියා මාර්ගය, නානාවිධ රැඩිකල් හා විරෝධතා කන්ඩායම් විසින් ඉදිරිපත් කරන

බංකොලොත් ඉදිරිදර්ශනය සමග සැසැඳීමට මට ඉඩ දෙන්න.

අගෝස්තු 2 වන දින *ග්‍රීන් ලෙෆ්ට් වීක්ලි* පත්‍රයෙහි ප්‍රකාශිත ලිපියකින් අවධාරනය කලේ, ඊස්රායල ආක්‍රමනයට හොවාඩ් ආන්ඩුව දෙන සහයෝගයට ජන සමාජයේ විරෝධය පල කිරීම සඳහා නම් නගර පුරා පැවැත්වෙන වඩාත් විශාල විරෝධතාවන් අවශ්‍ය වන බව යි. "ඉරාක යුද්ධයට එරෙහි උද්ඝෝෂනයෙන් ඉගෙන ගත හැකි ප්‍රධාන පාඩම නම්, කොතෙක් විශාල වුවත් එක් මහා විරෝධතා රැලියක් කිසි සේත් ම සෑහෙන්නේ නැති බවයි."

ඉරාක ආක්‍රමනයට එරෙහිව පැවැත්වූ ඉතිහාසයේ විශාලතම පෙලපාලි ප්‍රකාශයට පත් කලේ, එක්සත් ජනපදය හා එහි සගයන්ගේ යුද වියරුවට ලොව පුරා පැන නැගි විරෝධය යි. එම විරුද්ධත්වය ඉන් පසු වසර තුන තුල ගැඹුරු වී තිබේ. එහෙත් ඉරාක යුද්ධයේ අත් දැකීම පැහැදිලි කරන තවත් දෙයක් නම්, කොතෙක් විශාල වුවත් ස්වාධීන ඉදිරි දර්ශනයකින් තොර වූ විට ඕනෑ ම ව්‍යාපාරයක ඇති බෙලහීනකමයි. 2003 ගැටලුව වූයේ, එවකට පැවතියේ එක් එක් විරෝධතාවක් පමනක් වීම නොවේ. එම විරෝධතාවයේ ඉදිරි දර්ශනය වූයේ එක්සත් ජාතීන්ට හෝ බොහෝවිට ප්‍රන්සය විය හැකි එක් මහා බලවතෙකුට යුද්ධය වැලැක්වීම සඳහා බලපෑම් දැමීම වීමයි.

ලෙබනනයට පහර දෙන කාලයේ විරෝධතා සංවිධායකයන් සිය ඉල්ලීම් යොමු කලේ කෙලින් ම හොවාර්ඩ් ආන්ඩුවට ම ය. යුද්ධය නතර කරනු යන හවුලෙහි සාමාජිකයෙකු විසින් අගෝස්තු 16 වන දින *ග්‍රීන් ලෙෆ්ට් වීක්ලි* සංස්කරනයේ පල වූ ලිපියක සඳහන් වූයේ "අගමැති ජෝන් හොවාර්ඩ් ඒඑල්පී නායක කිම් බීස්ලි (ඕස්ට්‍රේලියානු කම්කරු පක්ෂය) හා වික්ටෝරියානු (ප්‍රාන්ත) අගමැති ස්ටීව් බ්‍රැක්ස්, ස්වෛරී රටක් ආක්‍රමනය කර එහි ජනතාව සංහාරය කිරීම ප්‍රසිද්ධියේ හෙලා දැකීමට අසමත් වීම ගැන ලජ්ජා විය යුතු ය." එය සහාග ආන්ඩුවෙන් ඉල්ලා සිටියේ ඊස්රායල ආක්‍රමනය හෙලා දැක එම රාජ්‍යය සමග සියලු සබඳතා බිඳ දමන ලෙසයි.

එම ලිපිය අවසන් වූයේ විරෝධතා ඉදිරි දර්ශනයේ පරිපූර්න බංකොලොත්කම කැටි කර දක්වමිනි. "මෙම යුද්ධය අවසන් කිරීම සඳහා මහජන විරෝධය බලමුලුගැන්වීම දිගටම පවත්වා ගැනීම අපට අවශ්‍ය ය. අවසානයේ දී හොවාර්ඩ්ට, ජෝර්ජ් බුෂ්ට, ටෝනි බ්ලෙයාර්ට හා එහුඩ් ඕල්මර්ට්ට අහන්නට සැලැස්විය හැක්කේ එම ක්‍රමය ට පමනි."

එවන් ඉදිරි දර්ශනයකින් සලකුනු කරන විශ්ලේෂනය සලකා බලන්න. එනම්, අත්‍යාවශ්‍ය ගැටලුව පවතින්නේ විවිධ අධිරාජ්‍යවාදී ආන්ඩුවල ප්‍රමුඛ තනතුරු දරන පුද්ගලයන් තුල ය.

අවසන් නිගමනය වන්නේ, ඔවුන් ඇහුම්කන් දෙන තෙක් හෝ ඉවත් කරන තෙක් විරෝධය පෑම දිගට ම පවත්වා ගෙන යා යුතු ය යන්න ය.

විද්‍යාත්මක විශ්ලේෂනයක් තුලින් ගලා එන්නේ ඊට සපුරා ම පටහැනි නිගමනයකි. එය, යුද්ධය සඳහා තල්ලුව පැන නගින්නේ තනි තනි අධිරාජ්‍යවාදී දේශපාලනඥයන්ගේ මනෝභාවයන් ගෙන් හෝ දේශපාලනයෙන් නොවන බව වටහා ගනියි. එය මුල් බැස ඇත්තේ ධනවාදී පද්ධතියේ ම හදවතෙහි ක්‍රියාවලීන් තුල ය. හදිසි කර්තව්‍ය වන්නේ කම්කරු පන්තියේ දේශපාලන සවිඥානකත්වය වැඩි වර්ධනය කිරීම හා ජාත්‍යන්තර සමාජවාදී ක්‍රියා මාර්ගය මත පදනම් වූ විප්ලවවාදී ව්‍යාපාරයක් ගොඩ නැගීම බව, මෙම විශ්ලේෂනය පැහැදිලි කරයි. සසප හා හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව වැඩ කටයුතු යොමු වී ඇත්තේ මෙම ඉදිරි දර්ශනය සාක්ෂාත් කිරීම වෙතට ය.

© www.wsws.org